ලංසු සඳහා ආරාධනයයි (RFB)

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතියේ (IRDCRP) පිරිවැය අරභයා ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් (IDA) ණය අංක 7743 LK – ලෝක බැංකුව වෙතින් ණයමුදලක් ලබාගෙන ඇති අතර, එම ණය මුදලින් කොටසක් පහත වගුවෙහි දැක්වෙන කුඩා වාරිමාර්ග ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තු යටතේ සිදුකරන යෝග්‍ය ගෙවීම් සඳහා යෙදවීමට අදහස් කරයි.

2. IRDCRP වෙනුවෙන් ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා, පහත වගුවේ දක්වා ඇති එක් එක් දිස්ත්‍රික්කයට අදාළ ප්‍රසම්පාදනයන් සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

Serial No	Description of Work	Direct Construction cost (DCC) (Rs. Mn)	Contract Period (Days)	CIDA Grade required and Speciality Bid security	Required Bid Security		Non Refundable Fee (Rs.)
					Bid security Amount (Rs)	Bid security Validity up to	
Ampara District							
1	Construction of Kadupuliyamadu Anicut with Channel System in Sagamam Upper Basin in Ampara District under IRDCRP. LK-IRDCRP-PMU-568049-CW-RFB/PID/AMP/1	63.28	270	C5 or above irrigation	633,000/-	18/02/2027	14,500/-
2	Construction of Medru Anicut with Channel System in Santhipuram Access Road Sagamam Upper Basin in Ampara District under IRDCRP.LK-IRDCRP-PMU-568050-CW-RFB/PID/AMP/2	71.35	300	C5 or above irrigation	714,000/-	18/02/2027	16,000/-
3	Improvements to New Access Flood Bund Road to with necessary structure in UrakkavelyKandam in Sagamam Irrigation Scheme in Ampara District under IRDCRP.LK-IRDCRP-PMU-568051-CW-RFB/PID/AMP/3	23.77	180	C6 or above irrigation	238,000/-	06/01/2027	6,500/-
4	Construction of Kaluthondai Anicut (Ammalveli) in Sagamam Lower Basin in Ampara District under IRDCRP.LK-IRDCRP-PMU-568053-CW-RFB/PID/AMP/4	65.15	300	C5 or above irrigation	652,000/-	18/02/2027	15,000/-
5	Construction of water control structure for efficient water management in Thmbiluvil Division in Ampara District under IRDCRP.LK-IRDCRP-PMU-568054-CW-RFQ/PID/AMP/5	7.36	90	C8 or above irrigation	74,000/-	06/01/2027	3,000/-
POLONNARUWA DISTRICT							
6	Rehabilitation of Kalu Ulpathwewa in Polonnaruwa District under IRDCRP.LK-IRDCRP-PMU-568058-CW-RFB/DAD/ POL/1	48.42	270	C6 or above irrigation	485,000/-	18/02/2027	12,400/-
7	Rehabilitation of Excise wewa in Polonnaruwa District under IRDCRP.LK-IRDCRP-PMU-568065-CW-RFB/DAD/POL/2	31.99	270	C6 or above irrigation	320,000/-	18/02/2027	8,500/-
Hambantota District							
8	Rehabilitation of Weligaththawewa in Hambanthota District, Department of Agrarian Development. LK-IRDCRP PMU -551695-CW-RJB(HM/Weligath	23.09	180	C6 or above irrigation	234,000/-	06/01/2027	6,500/-
9	Rehabilitation of Weheragodawewa in Hambanthota District, Department of Agrarian Development. LK-IRDCRP PMU 551697-CW-RFB(HM/Weheragod	46.02	270	C6 or above irrigation	460,000/-	18/02/2027	11,600/-
Jaffna District							
10	Rehabilitation of 07- ponds (Kavadipiddiyarkulam,Thamaraikulam,Paravaikulam, Vevilkulam,Irasapoovalkulam,Nunuwilkulam,Thaddankerni Kulam) LK-IRDCRP PMU-551704-CW-RFB(JAFF/07 PONDS)	23.76	180	C6 or above irrigation	238,000/-	06/01/2027	6,600/-
Mullaitivu District							
11	Rehabilitation of Muththuiankaddu Scheme in Mullaitivu District.LK-IRDCRP PMU-551707-CW-RFB (MUL – MUTHIV)	60.54	120	C5 or above irrigation	606,000/=	18/02/2027	14,000/-

3. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය (NCB) මගින් ලංසුකරණය මෙහෙයැවේ

4. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට , සාර්ථක ලංසුකරුවන් අසාධු ලේඛනයට ඇතුළත් නොවූවන් විය යුතු අතර ඉහත වගු වල දක්වා ඇති පරිදි එක් එක් ප්‍රසම්පාදනය සඳහා අදාළ ක්ෂේත්‍රය සහ ශ්‍රේණිය සඳහා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ(CIDA) ලියාපදිංචිය ලබා තිබිය යුතුය. රාජ්‍ය සන්තක ව්‍යවසාය (SOE) හෝ ආයතනවලට තරඟ කිරීමට සහ කොන්ත්‍රාත්තු හිමි කර ගැනීමට සුදුසුකම් ලබන්නේ ලෝක බැංකු ප්‍රසම්පාදන රෙගුලාසිවල III වන කොටසේ 3.23 වගන්තියට අනුකූලව පිළිගත හැකි අයුරින් තහවුරු කළ හැකි නම් පමණි.

5. කොන්ත්‍රාත්තුව හිමි කර ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා වන සුදුසුකම් ලේඛන ප්‍රසම්පාදන ලේඛනවල ඇතුළත් කර ඇත.

6. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අදාළ එක් එක් දිස්ත්‍රික් කාර්යාලයන්හි , ගොවිජන සංවර්ධන– නියෝජ්‍ය කොමසාරිස් /සහකාර කොමසාරිස් /පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ/ව්‍යාපෘති කාර්යාලය වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකි අතර, 2026 සැප්තැම්බර් 01 වන දින සිට 2026 සැප්තැම්බර් 23 වන දින දක්වා වැඩකරන දිනවල 9.00 පැය (පෙරවරු 9.00) සිට14.00 පැය (පස්වරු 2.00)දක්වාපහත දැක්වෙන අදාළ දිස්ත්‍රික් ලිපිනයන්ගෙන් ප්‍රසම්පාදන ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකිය.

District Name	Address	Contact Details
Ampara District	Chairman Project Procurement Committee, Integrated Ruban Development & Climate Resilience Project, Ministry of Agriculture,Livestock, Land and irrigation,123/2, Pannipitiya Road, Battramulla.	0112877550 fax 0112073044 Email :pmuirdcrp@gmail.com
Polonnaruwa District	Assistant Commissioner, Department of Agrarian Development, District Office, Polonnaruwa	0272222183 Email:acpolonnaruwa@gmail.com
Hambantota District	Assistant Commissioner, Department of Agrarian Development, District Office, Hambantota	047-2220192,0714406585, 0472220191 Email: addohambantota@gmail.com
Jaffna District	Deputy Commissioner, Department of Agrarian Development, District Office, Jaffna	021-2222396,0774764478, 021-2224058 Email:dodjaffna@yahoo.com
Mullaitivu District	Provincial Director of Irrigation, Department of Irrigation Northern Provincial Council New Colony Lane. A9 Road, Mankulam	021-2285445 Email: irrigationnp@yahoo.com

7. එක් එක් ලේඛනය සඳහා ඉහත (අයිතම අංක 2 හි) සඳහන් කර ඇති අදාළ නැවත ගෙවනු නොලබන ගාස්තුව ගෙවීමෙන් අනතුරුව එක් එක් දිස්ත්‍රික් කාර්යාලයෙහි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්/සහකාර කොමසාරිස්/ පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ සහ ඉහත අයිතම අංක 6 හි සඳහන් ඒකාබද්ධ ග්‍රාම–නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතියේ (IRDCRP), ප්‍රසම්පාදන කළමනාකරණ ඒකකය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් 2026 සැප්තැම්බර් 01 වන දින සිට 2026 සැප්තැම්බර් 23 වන දින දක්වා පෙ.ව. 09.00 සිට ප.ව. 02.00 දක්වා කාලය තුළ, අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති සම්පූර්ණ ලංසු තැබීමේ ලේඛන කට්ටලයක් මිලදී ගත හැකිය. ගෙවීම්, එක් එක් අදාළ කාර්යාලයේ සරප් / ගිණුම් අංශය වෙත මුදලින් ගෙවිය යුතුය.

8. පූර්ව ලංසු රැස්වීම 2026 සැප්තැම්බර් 11 වන දින 10.30 පැයට (පෙ.ව. 10.30 ට) ඉහත (අයිතම 6 හි) දක්වා ඇති එක් එක් අදාළ කාර්යාල ලිපිනයන්හිදී පැවැත්වේ. කැමැත්තක් දක්වන ලංසුකරුවන්ට තමන්ගේම වියදමින් මෙම හමුව සඳහා සහභාගී විය හැක.

9. එක් එක් ප්‍රසම්පාදනය සඳහා වෙන වෙනම, ඉහත වගුවේ (අයිතම 02 හි) සඳහන් කර ඇති වටිනාකම සහ දිනයට අදාළව, ලංසු ලේඛනයේ දක්වා ඇති නියමිත ආකෘතියට අනුව පිළියෙල කළ කොන්දේසි විරහිත ලංසු ඇපකරයක් ලංසුව සමඟ අමුණා තිබිය යුතුය.

10. 2026 සැප්තැම්බර් 23 වන දින 14:00 පැය ට (ප.ව. 02.00 ට) හෝ ඊට පෙර, ඉහත වගුවේ (අයිතම 6 හි) විස්තර දක්වා ඇති පරිදි, අදාළ කාර්යාලයේ අදාළ ලිපිනයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ලංසුගෙනවිත් භාරදීම / තැපැත් කිරීම සිදුකළ යුතුය.

11. ලංසු භාරගැනීම 2026 සැප්තැම්බර් 23 වන දින ප.ව. 14:00 පැය ට (ප.ව. 02.00 ට) අවසන් කෙරේ. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, ඉහත වගුවේ (අයිතම 6 හි) දක්වා ඇති එක් එක් අදාළ කාර්යාලයේදී සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ඇත. ඉහත සඳහන් කළ ලංසු අවසන් වන දිනයේදී රජයේ නිවේදනයක් හේතුවෙන් කාර්යාලය වසා තැබීමට සිදු වුවහොත්, ඊළඟ ළඟම ඇති රාජකාරි දිනය ලංසු අවසන් වන දිනය ලෙස සැලකෙන අතර, එදින නියමිත වේලාවට සහ ස්ථානයේදී ලංසු විවෘත කරනු ලැබේ.

සභාපති,
ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව,
ඒකාබද්ධ ග්‍රාම-නගර සංවර්ධන හා දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ ව්‍යාපෘතිය (IRDCRP)
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
නො. 123/2, පන්නිපිටිය පාර, බත්තරමුල්ල.
2026 සැප්තැම්බර් 01

දුරකථන : 011 2877 550 / 0112073 044
ඊ-මේල් : pmuirdcrp@gmail.com
irdcrp_moa@agrimin.gov.lk